# මැතිවරණ පැමිණිලි භාර ගැනීමට යාන්ත්‍රණයක්

## පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි

**අනුර ප්‍රේමලාල්**

මෙවර ජනාධිපතිවරණයේදී නම සංවිධානය මැතිවරණ නිරීක්ෂණ කටයුතු සූදුල්ව හා

මැතිවරණ පැමිණිලි භාර ගැනීම ශක්තිමත්ව කරගෙන යෑමට යාන්ත්‍රණයක් සකස් කර තිබෙන බව පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ නීතිඥ රෝහණ හෙට්ටිආරච්චි මහතා ප්‍රකාශ කරයි.

ඒ මහතා මේ බව සඳහන් කෙළේ ඊයේ (15) මරදන සමාජීය හා සාමූහික කේන්ද්‍රයේ පැවැති මෙවර ජනාධිපතිවරණය-2019 සිය සංවිධානයේ ප්‍රථම මාධ්‍ය සාකච්ඡාවට එක්වෙමින්ය.

© THE ASSOCIATED NEWSPAPERS OF CEYLON LTD. ALL RIGHTS RESERVED

එතුමා වැඩිදුරටත් අදහස් දක්වමින් මහතා මෙසේ කීය.....මේනවිට අපි මැතිවරණ නිරීක්ෂණ කටයුතු සඳහා ගයදහසක ප්‍රමාණයක් අපි යොදවා තිබෙනවා. එහි මූලික පියවර ලෙස මැතිවරණ නිරීක්ෂණ නිලධාරීන් සූම මැතිවරණ කොට්ඨාසයක්ම ආවරණය වන පරිදි පත් කර තිබෙන අතර ඒ සඳහා එකසිය හැට දෙනකු පත් කර තිබෙනවා. මේවනවිට විවිධ කරුණු වාර්තා වෙනවා. අපේ දිස්ත්‍රික් සම්බන්ධීකරක නිලධාරීන් ඇතුළු විවිධ කාර්යන් සඳහා නියෝජනයින් පත් කර තිබෙන අතර ඔවුන්ගෙන අපිට කොරතුරු නිරන්තරයෙන් අනාවරණය වෙනවා. පැමිණිලි ඒකකයට ලැබෙන පැමිණිලි අනුව ස්ෂණිකව මැදිහත්වීමට අපි අවශ්‍ය කටයුතු කරනවා. මේවනවිටත් අපිට ලැබී තිබෙන ලොකු පැමිණිලි අනුව අපි ක්‍රියාත්මක වෙන්න පටන් අරගෙන තියෙනවා. දිස්ත්‍රික්කවල මැතිවරණ කොමසාරිස්වරු හා දිස්ත්‍රික් සම්බන්ධීකරකවරු ආරාධනා අවශ්‍ය කටයුතු සිදුකෙරෙනවා.

ජාතික මට්ටමේ මැතිවරණ කොමිෂන් සභාව හරහා නොයෙකුත් මැතිවරණ නීති සංශෝධීම් තැවැත්වීමට අපි කටයුතු කරලා තිබෙනවා. ඒ අනුව ලැබෙන පැමිණිලිවල සංඛ්‍යාව වැඩිකරතාවාට වඩා ලැබෙන පැමිණිලි වෙනුවෙන් ක්‍රියාත්මක වීම යහපත් වෙනවා. පැෆරල් ඉතිහාසයේ වසර නිස්පහක කාලය තුල ප්‍රථම වතාවටම සමාජ මාධ්‍ය නිරීක්ෂණය අපි ආරම්භ කරලා තියෙනවා. ඒ සඳහා දසදෙනකුගෙන් යුක් කණ්ඩායමක් අද (16) සිට ක්‍රියාත්මක වෙනවා.

පැෆරල් සංවිධානයේ ජාතික සම්බන්ධීකාරක සූජීව ජයන්ත මහතා ..... පැෆරල් සංවිධානයේ නිරීක්ෂණ ක්‍රියාදමය ශක්තිමත් කර තිබෙන අතර ඊට ජනතාවගේ දායකත්වයද අවශ්‍ය බව පෙන්වා දුන්නේය

පැෆරල් සංවිධානයේ පැමිණිලි අංශයේ ප්‍රධානී නීතිඥ ඉසුරු කරවිට මහතා..... පැෆරල් පැමිණිලි ඒකකය සඳහා whatsapp/ viber 0704701155, ප්‍රධාන දුරකතන අංක 0112558570,0112558541 ෆැක්ස් අංක,0112558572, paffrel. complains@gmail.com යන අංක හා ලිපින භාවිත කරමින් පැමිණිලි එවන්නි කියා ජනතාවගෙන් ඉල්ලුවෝ අපි පළාත් වශයෙන්ද දුරකතන අංක හඳුන්වාදී තියෙනවා.

දිනමිණ